# අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ

# ඉතිහාසය

## 12, 13 ශ්‍රේණි

(2009 වර්ෂයේ ක්‍රියාත්මක වේ)

සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව
භාෂා මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම

## 1.0 හැඳින්වීම

නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ 2007 වැඩ සටහන යටතේ අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගයට අදාළව නව විෂය නිර්දේශයක් ක්‍රියාත්මක වන්නේ 2009 වර්ෂයේ දී ය.

ඒ අනුව ඉතිහාසය විෂය නිර්දේශය ද ජාතික ප්‍රතිපත්තිවලට අනුකූල ව ශිෂ්‍ය නිපුණතා වර්ධනයට උචිත වන අයුරින් සැකසී ඇත.

මෙම විෂය නිර්දේශය කොටස් 4න් යුක්තව ඉදිරිපත් කෙරේ.

1. ශ්‍රී ලංකාවේ ඉතිහාසය (ඈත අතීතයේ සිට ක්‍රි.ව 1978 දක්වා)
2. ඉන්දියාවේ ඉතිහාසය (ඈත අතීතයේ සිට 1206 දක්වා)
3. යුරෝපා ඉතිහාසය (ක්‍රි.ව.1500 සිට 1989 දක්වා)
4. නූතන ලෝකයේ ඉතිහාසය (ක්‍රි.ව. 1500 සිට 1989 දක්වා)

ඉතිහාසය විෂය හදාරන සියලුම සිසුන්ට ශ්‍රී ලංකාවේ ඉතිහාසය අනිවාර්ය වන අතර ඉන්දියාවේ ඉතිහාසය යුරෝපා ඉතිහාසය හා නූතන ලෝකයේ ඉතිහාසය යන කාණ්ඩ අතුරින් එක් විෂය කාණ්ඩයක් පමණක් තම කැමැත්ත මත තෝරාගත යුතුය.

මීට අමතර ව විෂය අන්තර්ගතයේ ද වෙනස්කම් සිදුකර ඇත.

- **ශ්‍රී ලංකාවේ ඉතිහාසය**

  * පැරණි නිර්දේශය අනුව නූතන අධිරාජ්‍යයේ වර්ධනය යන මාතෘකාව යටතේ සාකච්ජා වූ මිෂනාරි අධ්‍යාපනය හා බ්‍රිතාන්‍ය අධ්‍යාපන ප්‍රතිපත්ති ( කන්නන්ගර ප්‍රතිසංස්කරණ තෙක් ) පමණි. නව ප්‍රතිසංස්කරණවලට අනුව එම මාතෘකාව නිදහස් අධ්‍යාපනයේ වර්ධනය නම් උප මාතෘකාව යටතේ ක්‍රි.ව. 1981 දක්වා වූ වර්ධනය පිළිබඳ අධ්‍යයනයට යොමු කර ඇත.
  * සෝල්බරි ආණ්ඩුක්‍රමය හා ජාතික නිදහස දක්වා පමණක් වූ පැරණි නිර්දේශය නිදහසින් පසු ශ්‍රී ලංකාව නම් නව මාතෘකාවක් යටතේ නිදහසින් පසු ජාතික සංවර්ධනය සඳහා අනුගමනය කළ ප්‍රතිපත්ති හා ක්‍රියාමාර්ග, 1972 තෙක් පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයේ වර්ධනය, 1978 විධායක ජනාධිපති ආණ්ඩුක්‍රමය යන තේමා ඇතුළත් වන පරිදි නව නිර්දේශය පුළුල් කර ඇත.

- **ඉන්දියාවේ ඉතිහාසය**

  යටතේ වෙනස්වීමක් සිදුවී නොමැත.

- **යුරෝපා ඉතිහාසය**

* යුරෝපා ශිෂ්ටාචාරය හැඩ ගැසීමෙහිලා බලපෑ බලවේග, ඇමරිකානු නිදහස් සටන, දෙවන ලෝක මහා සංග්‍රාමයෙන් පසු ලෝකය නමින් නව මාතෘකා තුනක් එකතු කිරීම.
    - පැරණි නිර්දේශය අනුව යුරෝපා ඉතිහාසය විෂය නිර්දේශයේ ආරම්භ වුයේ යුරෝපය නූතන යුගයට අවතීර්ණ වීම යන්නෙනි. එහෙත් නව නිර්දේශයට අනුව යුරෝපා ශිෂ්ටාචාරය හැඩගැසීම පිළිබඳ ව ප්‍රථමයෙන් ම සාකච්ඡා කරයි. ඒ අනුව ග්‍රීක, රෝම, ක්‍රිස්තියානි සහ ඉස්ලාම් ශිෂ්ටාචාර යුරෝපය ගොඩනැගීමට බලපෑ ආකාරය ප්‍රථම මාතෘකාව වෙයි.

    - ඇමරිකානු නිදහස් සටන මාතෘකාව යටතේ ඇමරිකාවේ මුල් පදිංචිකරුවෝ, ජනපද බිහිවීම, නිදහස් සටන හා එහි ප්‍රතිඵල පිළිබඳව ඇතුළත් කර ඇත.
    - දෙවන ලෝක සංග්‍රාමයෙන් අවසන් වූ පැරණි නිර්දේශය වෙනුවට නව නිර්දේශය යටතේ අවසන් මාතෘකාව වශයෙන් පත්වී ඇත්තේ දෙවන ලෝක සංග්‍රාමයෙන් පසු ලෝකය යනුවෙනි. මේ යටතේ සමාජවාදී ධනවාදී බල කඳවුරු සහ නොබැඳි ජාතීන්, නිරවි යුද්ධය, මත ගැටුම්, එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ක්‍රියාකාරිත්වය යනා දී කරුණු අධ්‍යයනයට යොමු කර ඇත.
* මීට අමතරව පැවැති මාතෘකාවල අන්තර්ගතයන්හි වෙනස්කම් ද සිදුකර ඇත. එනම් පැරණි නිර්දේශයේ ඉතාලිය එක්සත් කිරීම, ජර්මනිය එක්සත් කිරීම යන මාතෘකාව වෙනුවට ක්‍රි.ව. 1815 න් පසු ලිබරල්වාදී හා ජාතිකවාදී චින්තනයේ සහ බලවේගවල වර්ධනය නමින් වෙනස් කර මෙම චින්තනයන් ප්‍රායෝගිකව ක්‍රියාත්මක වීම යටතේ ඉතාලිය එක්සත් කිරීම හා ජර්මනිය එක්සත් කිරීම අධ්‍යයනයට යොමු කර ඇත.

- **නූතන ලෝක ඉතිහාසය**

* ඉන්දියාව හා යුරෝපය ඇතුළත් තෝරා ගැනීමේ විෂය කොටස් තුළට නූතන ලෝක ඉතිහාසය නම් නව නිර්දේශයක් හඳුන්වා දීම මෙමගින් සිදු කෙරේ. මෙම නිර්දේශය තුළින් ක්‍රි.ව. 1500 පසු ආසියා, අප්‍රිකා, යුරෝපා හා ඇමරිකානු කලාප තුළ සංසිද්ධීන් අධ්‍යයනයට යොමු කර ඇත.

* මෙම විෂය නිර්දේශය 12 සහ 13 ශ්‍රේණි සඳහා වුවකි. ඒ අනුව පහත සඳහන් ආකාරයට විෂය අන්තර්ගතය එක් එක් ශ්‍රේණි සඳහා ක්‍රියාත්මක කිරීමට සංවිධානය කරගත යුතුවේ.

## 2.0 විෂයය නිර්දේශයේ අරමුණු

- කාලානුපිළිවෙළ, මූලාශ්‍ර විවේචනය හා හේතුඵල සම්බන්ධය ඇසුරින් ගොඩනැගෙන විචාරාත්මක ශික්ෂණය හා දැනුම ප්‍රායෝගික ජීවිතයට භාවිත කිරීම.
- දේශීය අනන්‍යතාවට හා ජාතික ඒකාග්‍රතාවට තුඩු දෙන සාධක විමර්ශනය කිරීම.
- අතීතය හැදෑරීමෙන් ලැබෙන අවබෝධය තුළින් වර්තමානය තේරුම් ගැනීම.
- කාලය හා අවකාශය පදනම් කොට ගෙන ශිෂ්ටාචාරයේ විකාශනය හැදෑරීමෙන් සමාජයේ පවත්නා විවිධත්වය ඔස්සේ දිවෙන පොදු සාම්‍යය පිළිබඳ දැනුවත් වීම.
- ජාතික ප්‍රශ්න තුලනාත්මක ව අධ්‍යයනය කිරීමට පෙළඹීම.

## වාර සඳහා යෝජිත නිපුණතා මට්ටම්

| විෂය | | ලංකාවේ ඉතිහාසය | ඉන්දියාවේ ඉතිහාසය | යුරෝපා ඉතිහාසය | නූතන ලෝක ඉතිහාසය |
|---|---|---|---|---|---|
| 12 වන ශ්‍රේණිය | 1 වාරය | 1.1, 1.2, 2.1, 3.1, 3.2, 4.1, 4.2, 5.1, 5.2, 5.3 | 1.1, 1.2, 2.1, 2.2, 3.1, 3.2 | 1.1, 1.2, 2.1.2.2, 2.3, 3.1 | 1.1, 1.2, 1.3, 1.4, 1.5, 2.1, |
| | 2 වාරය | 5.4, 5.5, 5.6, 5.7 6.1, 6.2 | 3.3, 4.1, | 3.2, 3.3, 4.1, 4.2 5.1 | 2.1, 3.1, 3.2, 4.1, 4.2 |
| | 3 වාරය | 6.3, 6.4,7.1, 7.2, 7.3 | 4.2, 5.1, 5.2, 5.3, | 6,1, 6.2, 6.3, 7.1, 7.2, 8.1, 8.2 | 4.3, 4.4, 4.5, 5.1, 5.2, 5.3, 5.4, |
| 13 වන ශ්‍රේණිය | 1 වාරය | 8.1, 8.2, 9.1, 9.2, 9.3, 10.1 | 6.1, 6.2, 7.1, 7.2, | 9.1, 9.2, 10.1, 10.2 | 7.1, 7.2, 8.1, 8.2 9.1, |
| | 2 වාරය | 10.2,10.3, 11.1, 11.2, 12.1, 12.2, 13.1, 13.2 | 8.1, 8.2,8.3 9.1, 9.2, | 11.1, 11.2, 12.1, 12.2 | 9.2, 10.1, 10.2, 10.3, 11.1, 11.2 |
| | 3 වාරය | 14.1, 14.2, 15.1, 16.1, 16.2, 17.1, 17.2 | 10,1, 102, 11.1, 11.2, 11.3, 11.4 | 13.1, 13.2, 14.1, 14.2 15.1, 15.2 | 12.1, 12.2, 12.3, 13.1, 13.2, 13.3, 13.4, 13.4, 13.5 |

## 3.0 විෂය නිර්දේශය

### 3.1 - 12 වන ශ්‍රේණිය ශ්‍රී ලංකාවේ ඉතිහාසය (ඈත අතීතයේ සිට ක්‍රි.ව 1978 දක්වා)

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | කාලච්ඡේද ගණන |
|---|---|---|---|
| 1.0 කාලානුපිළිවෙළ, මූලාශ්‍ර විවේචනය හා හේතුඵල සම්බන්ධය ඇසුරින් ගොඩනැගෙන විචාරාත්මක ශික්ෂණය හා දැනුම ප්‍රායෝගික ජීවිතයට භාවිත කරයි. | 1.1. සාහිත්‍ය මූලාශ්‍ර ඇසුරින් ඓතිහාසික කරුණු ගොඩනගා ගත හැකි ආකාරය පිළිබඳ ව විග්‍රහ කරයි.<br>1.2 පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර ඇසුරින් ඓතිහාසික කරුණු හෙළි කර ගත හැකි ආකාරය පිළිබඳ සොයා බලයි. | • ශ්‍රී ලංකාවේ ඉතිහාසය හැදෑරීමට ඇති මූලාශ්‍ර<br>• මූලාශ්‍ර වර්ග කිරීම<br>• සාහිත්‍ය<br>• දේශීය<br>• විදේශීය<br>• පුරාවිද්‍යාත්මක<br>• නටබුන්<br>• සෙල්ලිපි<br>• කාසි | 10 |
| 2.0 අභ්‍යන්තර හා බාහිර පිහිටීම අනුව රටක ඉතිහාසය තීරණය වන බවට සාධක ඉදිරිපත් කරයි. | 2.1 භූගෝලීය සාධක ශ්‍රී ලාංකික ශිෂ්ටාචාරය හැඩ ගැසීමට බලපා ඇති ආකාරය විග්‍රහ කරයි. | • ශ්‍රී ලංකාවේ ඉතිහාසය හැඩගැසීම කෙරෙහි බලපෑ භූගෝලීය සාධක<br>• ශ්‍රී ලංකාවේ භූගෝලීය පිහිටීම<br>• භූගෝලීය පිහිටීම ඉතිහාසය කෙරෙහි ඇති කළ බලපෑම | 10 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | කාලච්ඡේද ගණන |
|---|---|---|---|
| 3.0 ශ්‍රී ලාංකික ශිෂ්ටාචාරයේ ආරම්භය, වර්ධනය හා ව්‍යාප්තිය පිළිබඳ අධ්‍යයනය කර ඓතිහාසික විකාශනය හා ප්‍රවණතා පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි. | 3.1 ශ්‍රී ලංකාවට ඉතා දීර්ඝ අභිමානවත් ඉතිහාසයක් ඇති බවට ප්‍රාග් ඓතිහාසික යුගය ඇසුරින් විග්‍රහ කරයි.<br>3.2 ශ්‍රී ලංකාවේ මුල් ජනාවාස පිළිබඳ විමර්ශනය කිරීම තුළින් කාලය හා අවකාශය අනුව ශ්‍රී ලාංකික ශිෂ්ටාචාරයේ විකාශනය සිදු වූ ආකාරය පිළිබඳ තොරතුරු ගොනු කරයි. | • ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික යුගය<br>• මුල් ජනාවාස පිහිටුවීම පෙර අවධිය<br>• මුල් ජනාවාස පිහිටුවීමට පෙර අවධිය<br>• මුල් ජනාවාස පිහිටුවීම හා ව්‍යාප්තිය විජයගේ සිට දේවානම්පියතිස්ස දක්වා | 06 |
| 4.0 සංවිධානාත්මක ආගමක් ඇසුරින් සදාචාරවත් සමාජයක් ගොඩ නැගෙන ආකාරය පිළිබඳ කරුණු විමසා බලා යහපත් ගුණාංග රැක ගැනීමට දායක වෙයි. | 4.1 ප්‍රාග් බෞද්ධ අවධියේ පැවැති ඇදහිලි හා විශ්වාස පිළිබඳ විමසයි.<br>4.2 ශ්‍රී ලාංකික සමාජය බුදු දහම ඇසුරින් ගොඩනැගුණ ආකාරය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි. | • ශ්‍රී ලංකාවේ බුදුදහම ස්ථාපනය කිරීම හා ව්‍යාප්තිය<br>• මහින්දාගමනයට පෙර ඇදහිලි හා විශ්වාස<br>• බුද්ධාගම පිහිටුවීම හා ව්‍යාප්තිය<br>• ඉන්දියානු පසුබිම<br>• ශ්‍රී ලංකාවේ බුදුදහම ස්ථාපිත කිරීම<br>• බුදුදහම පිහිටුවීමෙන් පසු ශ්‍රී ලංකාවේ ඇති වූ සමාජීය හා සංස්කෘතික වෙනස්කම් | 10 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | කාලච්ඡේද ගණන |
|---|---|---|---|
| 5.0 ශ්‍රී ලංකාවේ විවිධ කාලවකවානුවල සිදු වූ දේශපාලන සංසිද්ධීන් විමර්ශනය කරමින් ඉන් ලද ආභාසය වර්තමානය හා අනාගතය සාර්ථක කර ගැනීමට ඵලදායීව භාවිත කරයි. | 5.1පාලකයාගේ ස්වරූපය අනුව රාජ්‍යයක නැගීම හා පිරිහීම සිදුවන ආකාරය අනුරාධපුර රාජධානියෙහි දේශපාලනය ඇසුරින් විග්‍රහ කරයි. | • රජරට ශිෂ්ටාචාරයේ දේශපාලන විකාශනය<br>• අනුරාධපුර රාජධානිය<br>• පණ්ඩුකාභය රජුගේ සිට පස්වන මිහිඳු රජු දක්වා දේශපාලන විකාශය | 45 |
| | 5.2විදේශීය බලපෑම් තුළින් රටක ඉතිහාසය වෙනස්වන ආකාරය අනුරාධපුර රාජධානි ඇසුරින් තොරතුරු ගොනු කරයි. | • විදේශීය රටවල් සමග පැවති සබඳතා හා ඒවායේ බලපෑම්<br>• රාජ්‍යත්වයේ විකාශය<br>• පරිපාලන තන්ත්‍රය | |
| | 5.3 අනුරාධපුර රාජධානියේ පිරිහීමට හා බිඳවැටීමට හේතු වූ කරුණු තර්කානුකූලව නිගමනය කරයි. | • අනුරාධපුර රාජධානියේ පරිහානිය හා බිඳවැටීම | |
| | 5.4විදේශීය බලපෑම් තුළින් රටක ඉතිහාසය වෙන්සවන ආකාරය පොළොන්නරු රාජධානිය ඇසුරින් තොරතුරු ගොනු කරයි. | • පොළොන්නරු රාජධානිය<br>• චෝළ පාලනය | |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | කාලච්ඡේද ගණන |
|---|---|---|---|
| | . 5.5 පාලකයාගේ ස්වරූපය අනුව රාජ්‍යයක නැගීම හා පරිහානිය සිදුවන ආකාරය පොළොන්නරු රාජධානියේ දේශපාලනය ඇසුරින් විග්‍රහ කරයි. | • පළමු වන විජයබාහු රජුගේ සිට කාලිංග මාඝ දක්වා දේශපාලන විකාශය | |
| | 5.6 අතීත ශ්‍රේෂ්ඨ කාන්තා නායකත්වයට ගරු කරයි. | • කාන්තා නායකත්වය | |
| | 5.7 විදේශීය බලපෑම් තුළින් රටක ඉතිහාසය වෙනස්වන ආකාරය පොළොන්නරු රාජධානිය ඇසුරින් තොරතුරු ගොනු කරයි. | • විදේශ රටවල් සමඟ පැවැති සම්බන්ධතා හා ඒවායේ බලපෑම<br>• රාජ්‍යත්වයේ විකාශනය<br>• පරිපාලන තන්ත්‍රය | |
| | 5.8 ශක්තිමත් රාජ්‍යයක්ව පැවති පොළොන්නරුව පිරිහීමට හා බිඳවැටීමට හේතු වූ කරුණු තර්කානුකූලව ගොඩනගයි. | • පොළොන්නරුව රාජධානියේ පරිහානිය හා බිඳවැටීම | |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | කාලච්ඡේද ගණන |
|---|---|---|---|
| 6.0 රජරට ශිෂ්ටාචාරයේ අර්ථක්‍රමය හා සමාජය පිළිබඳ විමර්ශනය කරමින් ජාතික උරුමයන් හා අනන්‍යතාව රැක ගැනීමට කටයුතු කරයි. | 6.1 රජරට ශිෂ්ටාචාරයේ ප්‍රධාන ජීවිකාව වූ කෘෂිකර්මාන්තය සකස් වී තිබූ ආකාරය පිළිබඳ විමසා බලා එහි ආදර්ශ වර්තමානය සඳහා ගලපයි. | • රජරට ශිෂ්ටාචාරයේ අර්ථ ක්‍රමය හා සමාජය<br>• කෘෂිකර්මය | 40 |
| | 6.2 වියළි කලාපයම පෝෂණය කළ වාරිමාර්ග පිළිබඳ විමර්ශනය කරමින් අතීත උරුමයන් ආරක්ෂා කිරීමට පෙළඹෙයි. | • වාරිමාර්ග | |
| | 6.3 රජරට ශිෂ්ටාචාරයේ වෙළෙඳාම, කර්මාන්ත හා තාක්ෂණය එම ශිෂ්ටාචාරය ශක්තිමත් ලෙස ගොඩනැගීමට දායක වූ අයුරු පරීක්ෂා කරමින් එම උරුමයන් මතුවටත් ආරක්ෂා කිරීමට කටයුතු කරයි. | • වෙළෙඳාම කර්මාන්ත හා තාක්ෂණය | |
| | 6.4 රජරට ශිෂ්ටාචාරයේ සංස්කෘතික අභිවර්ධනය විමසා බලා තම අනන්‍යතාවය ආරක්ෂා කිරීමට කටයුතු කරයි. | • සංස්කෘතික අභිවර්ධනය | |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | කාලච්ඡේද ගණන |
|---|---|---|---|
| 7.0ශ්‍රී ලංකාවේ විවිධ කාලවකවනු තුළ සිදු වු දේශපාලන සමාජ ආර්ථික සංසිද්ධීන් විමර්ශනය කරමින් ඉන් ලද ආභාසය වර්තමානය හා අනාගතය සාර්ථක කර ගැනීමට ඵලදායීව භාවිත කරයි. | 7.1 පොළොන්නරු රාජධානියේ බිඳවැටීමෙන් පසු බිහි වු රාජධානි පිළිබඳ තොරතුරු ගොනු කරයි. | • රජරට ශිෂ්ටාචාරය බිඳ වැටීමේ සිට දහසය වන සියවස ආරම්භය දක්වා ලංකාව<br>• රාජධානි විතැන්වීම, දඹදෙණිය, යාපහුව, කුරුණෑගල, ගම්පොළ, කෝට්ටේ<br>• යාපනය රාජධානිය | 30 |
| | 7.2 පොළොන්නරුව බිඳ වැටීමෙන් පසු බිහි වු රාජධානි විදෙස් රටවල් සමඟ පැවැත් වු සම්බන්ධතා හා එහි බලපෑම පිළිබඳ විග්‍රහ කරයි | • විදේශ රටවල් සමඟ පැවැති සම්බන්ධතා හා එහි බලපෑම | |
| | 7.3 පොළොන්නරුව බිඳ වැටීමෙන් පසු බිහි වු රාජධානිවල ආර්ථික, සමාජ හා සංස්කෘතික තොරතුරු විමර්ශනය කරමින් තම අනන්‍යතාවය රැක ගැනීමට දායක වෙයි. | • ආර්ථිකය<br>• සමාජීය හා සංස්කෘතික | |

## 3.2 - 12 වන ශ්‍රේණිය ඉන්දියාවේ ඉතිහාසය (ඈත අතීතයේ සිට 1206 දක්වා)

| නිපුණතාව | නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලච්ඡේද ගණන |
|---|---|---|---|
| 01. කලානුපිළිවෙළ, මූලාශ්‍ර විවේචනය හා හේතුඵල සම්බන්ධය ඇසුරින් ගොඩනැගෙන විචාරාත්මක ශික්ෂණය හා දැනුම ප්‍රායෝගික ජීවිතයට භාවිත කරයි. | 1.1 ඉන්දියා ඉතිහාසය ගොඩනැගිමේලා සාහිත්‍ය මූලාශ්‍රය උපයෝගි කර ගනියි.<br>1.2 ඉන්දියා ඉතිහාසය ගොඩනැගීම සඳහා පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර දායක කර ගනියි. | • ප්‍රධාන ඓතිහාසික මූලාශ්‍රය<br>• සාහිත්‍යමය මූලාශ්‍රය<br>• පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය | 08 |
| 0.2 කාලය හා අවකාශය පදනම් කරගෙන ශිෂ්ටාචාරයේ විකාශනය හැදෑරීමෙන් සමාජයේ පවත්නා විවිධත්වය ඔස්සේ දිවෙන පොදු සාම්‍යය පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි. | 2.1 භූගෝලීය පිහිටීම ඉන්දිය ඉතිහාසය කෙරෙහි බලපෑ ආකාරය පිළිබඳ ව ගවේෂණාත්මක අවබෝධයක් ඇති කර ගනියි.<br>2.2 විශාලත්වය හා විවිධත්වය ඉන්දියානු ඉතිහාසය කෙරෙහි බලපා ඇති ආකාරය විග්‍රහ කරයි. | • භූගෝලීය සාධක ඉන්දියානු ඉතිහාසය කෙරෙහි බලපෑ ආකාරය<br>• භූගෝලීය පිහිටීම (බාහිර/අභ්‍යන්තර)<br>• මධ්‍ය ආසියාවෙන් වෙන්ව පිහිටීම<br>• වයඹ දිග කපොලු හා දුර්ග මාර්ග<br>• භූ විෂමතාව<br>• ගංගා නිම්න, වාරය<br>• කඳුවැටි<br>• තැනිතලා හා සානු<br>• කාන්තාර<br>• දකුණු ඉන්දියාවේ පිහිටීම<br>• ඉන්දියාවේ විශාලත්වය හා විවිධත්වය | 14 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | කාලච්ජේද ගණන |
|---|---|---|---|
| 3.0 ඉන්දු නිම්න හා වෛදික සභ්‍යත්වය ඇසුරින් ඉන්දියානු ශිෂ්ටාචාරයේ ප්‍රභවය පරීක්ෂා කරයි. | 3.1 පුරාවිද්‍යාත්මක සාක්ෂි ඇසුරින් ඉන්දු නිම්න ශිෂ්ටාචාරයේ ආරම්භය, ස්වරූපය හා එහි පරිහානිය පිළිබඳ ඉතිහාසය ගොඩ නගයි. | • ඉන්දියානු ශිෂ්ටාචාරයේ ප්‍රභවය<br>• ඉන්දු නිම්න ශිෂ්ටාචාරය<br>• ආරම්භය (දේශීය හෝ විදේශීය)<br>• ව්‍යාප්තිය<br>• ඉන්දු නිම්න ශිෂ්ටාචාරයේ නාගරික ලක්ෂණ | 40 |
| | 3.2 ඉන්දු නිම්න ශිෂ්ටාචාරයෙන් පසුකාලීන ශිෂ්ටාචාර වලට ලැබුණු දායාද විමර්ශනය කරයි. | • මෙම ශිෂ්ටාචාරයෙන් ලද දායාද<br>• නාගරිකත්වය<br>• ආර්ථිකය<br>• සංස්කෘතිය | |
| | 3.3 සාහිත්‍යමය මූලාශ්‍ර ඇසුරෙන් වෛදික ශිෂ්ටාචාරය පිළිබඳ ඉතිහාසය ගොඩ නගයි. | • වෛදික සභ්‍යත්වය<br>• ඍග් වෛදික යුගය<br>• මුල් ජන පදිකයින්ගේ සංක්‍රමණ හා ව්‍යාප්තිය<br>• සමාජ, ආර්ථික, සංස්කෘතිය<br>• පශ්චාත් වෛදික යුගය<br>• සමාජ හා ආර්ථික තත්ත්වය<br>• සංස්කෘතිය | |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | කාලච්ඡේද ගණන |
|---|---|---|---|
| 4.0 ශිෂ්ටාචාර වර්ධනය ක්‍රමිකව කාලානුරූපව සිදුවන බව ඉන්දියාවේ ඓතිහාසික සිදුවීම් ඇසුරින් ගොඩනගයි. | 4.1 ගෝත්‍ර අවධියේ සිට අධිරාජ්‍යය අවධිය දක්වා ඉන්දීය ශිෂ්ටාචාරය වර්ධනය සිදු වූ ආකාරය පරීක්ෂා කරයි.<br><br>4.2 ආගමික හා දාර්ශනික චින්තනය ඉන්දීය ශිෂ්ටාචාරය ගොඩනැගීමට දායක වී ඇති ආකාරය විමර්ශනය කරයි. | • අධිරාජ්‍යය දක්වා ඉන්දියාව<br>• දේශපාලන තත්ත්වය<br>• පශ්චාත් වෛදික යුගයේ දේශපාලන තත්ත්වය<br>• 7 සහ 6 වන සියවස්වල උතුරු ඉන්දියාවේ දේශපාලන තත්ත්වය<br>• සොළොස්මහා ජනපද<br>• මගධ අධිරාජ්‍යයේ ප්‍රභවය හා ව්‍යාප්තිය<br><br>• ඉන්දියානු ආගමික හා දාර්ශනික චින්තනයේ විකාශය<br>• බ්‍රාහ්මණවාදය, ජෛනාගම බුද්ධාගම හා වෙනත් ආගම් | 42 |

| නිපුණතාව | නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලච්ඡේද ගණන |
|---|---|---|---|
| 5.0 මෞර්ය අධිරාජ්‍යයේ වර්ධනය හා පරිහානිය ඇසුරින් රාජ්‍යයක් ශක්තිමත්ව පවත්වා ගැනීමට පිළිපැදිය යුතු කරුණු පිළිබඳ ව සැලකිලිමත් වෙයි. | 5.1 ශක්තිමත් මෞර්ය අධිරාජ්‍යයක් ගොඩනැගූ ආකාරය විග්‍රහ කරයි.<br><br>5.2 අධිරාජ්‍යක පැවැති සුවිශේෂ ලක්ෂණ මෞර්ය අධිරාජ්‍ය පාලනය ඇසුරින් පරීක්ෂා කරයි.<br><br>5.3 ප්‍රබල අධිරාජ්‍යයක පරිහානිය කෙරෙහි බලපාන සාධක මෞර්ය අධිරාජ්‍ය ඇසුරින් විග්‍රහ කරයි. | • මෞර්ය අධිරාජ්‍යය<br>• මෞර්ය බල ව්‍යාප්තිය<br><br>• පාලන තන්ත්‍රය<br><br>• අශෝක ධර්මය<br><br>• සංස්කෘතික අභිවර්ධනය<br><br>• මෞර්ය අධිරාජ්‍යයේ පරිහානිය | 25 |

### 3.3 - 12 වන ශ්‍රේණිය යුරෝපා ඉතිහාසය (ක්‍රි.ව.1500 සිට 1989 දක්වා)

| නිපුණතාව | නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලච්ඡේද ගණන |
|---|---|---|---|
| 1.0 විවිධ බලවේග වල බලපෑම් මුල් කර ගනිමින් ශිෂ්ටාචාර ගොඩනැගෙන ආකාරය යුරෝපා ශිෂ්ටාචාරය ඇසුරින් විග්‍රහ කරයි. | 1.1 ග්‍රීක, රෝම සහ ක්‍රිස්තියානි ශිෂ්ටාචාර යුරෝපා ශිෂ්ටාචාරයට පදනම සැකසූ ආකාරය විග්‍රහ කරයි. | • යුරෝපා ශිෂ්ටාචාරය හැඩගැසීම සඳහා බලපෑ බලවේග<br>• ග්‍රීක ශිෂ්ටාචාරය<br>• රෝම ශිෂ්ටාචාරය<br>• ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය | 15 |
| | 1.2 ශක්තිමත් යුරෝපා ශිෂ්ටාචාරයට ඉස්ලාම් ශිෂ්ටාචාරයෙහි බලපෑම සිදු වූ ආකාරය පරීක්ෂා කරයි. | • ඉස්ලාම් ශිෂ්ටාචාරය | |
| | | • යුරෝපය නූතන යුගයට අවතීර්ණ වීම | |
| 2.0 යුරෝපයේ සිදුවන වෙනස්කම් ලෝකය කෙරෙහි බලපෑ ආකාරය විග්‍රහ කරයි. | 2.1 වැඩවසම් ක්‍රමයේ මූලික ලක්ෂණ අධ්‍යයනය කරමින් යුරෝපා ශිෂ්ටාචාරයේ වර්ධනයේ සන්ධිස්ථානයක් වශයෙන් එහි වැදගත්කම විග්‍රහ කරයි. | • වැඩවසම් ක්‍රමය හා වැඩවසම් ක්‍රමයේ පරිහානිය | 18 |
| | 2.2 යුරෝපා ශිෂ්ටාචාරය නූතන යුගයට අවතීර්ණ වූ ආකාරය පුනරුදය, නව සොයා ගැනීම් හා ජාතික රාජ්‍යයන්ගේ නැගීම ඇසුරින් විග්‍රහ කරයි. | • නවයුගයකට අවතිර්ණවීම<br>• පුනරුදය<br>• ජාතික රාජ්‍යයන්ගේ නැගීම<br>• විද්‍යාත්මක සොයා ගැනීම් | |
| | 2.3 දේශගවේෂණ හා යුරෝපා බලව්‍යාප්තිය ඇසුරින් අධිරාජ්‍යවාදයට පදනම සකස් වූ ආකාරය පරීක්ෂා කරයි. | • දේශගවේෂණ හා යුරෝපීය බල ව්‍යාප්තිය | |

| නිපුණතාව | නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලච්ඡේද ගණන |
|---|---|---|---|
| 3.0 ගොඩනැගෙමින් තිබූ මනුෂ්‍ය ශිෂ්ටාචාරය විවිධ බලවේග හේතුකොට පුළුල් විපර්යාසවලට භාජනය වූ බව අවබෝධ කරගෙන වර්තමානයට මුහුණ දීමේ ශක්තිය ලබා ගනියි. | 3.1 ක්‍රිස්තු ශිෂ්ටාචාරය පදනම් කරගෙන හැඩගැසී තිබූ යුරෝපා ශිෂ්ටාචාරය තුළ ආගමික ප්‍රතිසංස්කරණ ඇති වීමට හේතු විග්‍රහ කරයි. | • ආගමික ප්‍රතිසංස්කරණ හා ප්‍රතිරෙපරමාදු ප්‍රතිසංස්කරණ | 20 |
| | 3.2 රෙපරමාදු හා ප්‍රතිරෙපරමාදු ව්‍යාපාර නිසා යුරෝපා ශිෂ්ටාචාරය තුළ ඇති වූ විපර්යාස පිළිබඳ තොරතුරු ගොනු කරයි. | • ආගමික ප්‍රතිසංස්කරණ වලට පසුබිම<br>• රෙපරමාදු ව්‍යාපාරය<br>• ප්‍රතිරෙපරමාදු ව්‍යාපාරය | |
| | 3.3. ජර්මනිය යුධ පිටිය කොටගෙන ඇති වූ යුද්ධ මාලාව පිළිබඳ විමර්ශනය කරයි. | • තිස් අවුරුදු යුද්ධය | |
| 4.0 මානව අයිතිවාසිකම් දිනා ගැනීමට දීර්ඝ කාලයක් තිස්සේ ප්‍රයන්ත දැරීමට සිදු වූ ආකාරය විග්‍රහ කරයි. | 4.1 රජුගේ බලතල අභිබවා පාර්ලිමේන්තු බලය වර්ධනය කර ගැනීමට එංගලන්ත වාසීන් ගෙන ගිය අරගලය මානව සංහතියේ ප්‍රගමනයට දායක වූ අයුරු විග්‍රහ කරයි. | • බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තු ක්‍රමය<br>• පාර්ලිමේන්තු ක්‍රමයේ ආරම්භය සහ වර්ධනය හා ප්‍රතිඵල | 13 |
| | 4.2 පාර්ලිමේන්තු ක්‍රමයේ ප්‍රධාන ලක්ෂණ බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තු ක්‍රමය ඇසුරින් විග්‍රහ කරයි. | • පාර්ලිමේන්තු ක්‍රමයේ ලක්ෂණ<br>• නියෝජන ක්‍රමය<br>• පක්ෂ ක්‍රමය<br>• කැබිනට් ක්‍රමය | |
| 5.0 කාර්මික විප්ලවය මිනිස් ක්‍රියාකාරිත්වය වෙනසකට ලක් කළ ආකාරය විග්‍රහ කරයි. | 5.1 අතින් කළ වැඩ යන්ත්‍රයට භාරදුන් කාර්මික විප්ලවය ලෝකයේ ගමන්මග වෙනස් කිරීමට බලපෑ ආකාරය පිළිබඳ තොරතුරු ගොනු කරයි. | • කාර්මික විප්ලවය<br>• ආරම්භය<br>• ව්‍යාප්තිය<br>• ප්‍රතිඵල | 13 |

| නිපුණතාව | නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලච්ඡේද ගණන |
|---|---|---|---|
| 6.0 සාමුහිකව ක්‍රියාකිරීමෙන් තම අයිතිවාසිකම් දිනා ගත හැකි බව ඇමරිකානු නිදහස් සටන ඇසුරින් විග්‍රහ කරයි. | 6.1 ඇමරිකාවේ වාසය කළ මුල් පදිංචිකරුවන් පිළිබඳ තොරතුරු ගොනු කරයි.<br><br>6.2 නව ලෝකය යුරෝපා ශිෂ්ටාචාරයට විවර වු ආකාරය ජනපද බිහිවීම ඇසුරින් පරීක්ෂා කරයි<br><br>6.3 අධිරාජ්‍යයෙන් නිදහස්වීම සඳහා කළ සටන හා සම්මත කරගත් ආණ්ඩුක්‍රම ව්‍යාවස්ථාව නිසා ඇමරිකානු නිදහස් සටන ලෝක ඉතිහාසයේ වැදගත් වන ආකාරය විග්‍රහ කරයි. | • ඇමරිකානු නිදහස් සටන<br>• මුල් පදිංචිකරුවෝ<br>• යුරෝපා ජාතීන් ඇමරිකාවට පැමිණි අවධියේ එහි වාසය කළ මුල් පදිංචිකරුවෝ.<br>( රතු ඉන්දියානු, ඇස්ටෙක්, ඉන්කා, මායා)<br>• ජනපද බිහිවීම<br>• යුරෝපා ජාතීන් ඇමරිකාවට සංක්‍රමණය වීමට හේතු<br>• යුරෝපා ජාතීන් ( ස්පාඤ්ඤ, ප්‍රංශ, ඉංග්‍රීසි) ඇමරිකාවේ ජනපද පිහිටුවීම<br>• එංගලන්තය යටතේ ජනපද පාලනය වු ආකාරය<br>• නිදහස් සටන<br>• ජනපද වාසීන්ගේ ජයග්‍රහණයට හේතු<br>• නිදහස ලැබීම හා නව ආණ්ඩුක්‍රමයන් සම්මත කර ගැනීම. | 12 |

| නිපුණතාව | නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලච්ඡේද ගණන |
|---|---|---|---|
| 7.0 බලවත් අරගලයකින් පසු දිනාගත් මානව අයිතීන් ආරක්ෂා කිරීමට කටයුතු කරයි. | 7.1 විවිධ විෂමතා ඇසුරින් විප්ලවයන් ගොඩනැගෙන බව ප්‍රංශ විප්ලවය ඇසුරින් විග්‍රහ කරයි. | • ප්‍රංශ විප්ලවය<br>• විප්ලවයේ වැදගත්කම<br>  • ප්‍රංශයේ පැරණි රාජාණ්ඩු ක්‍රමය<br>  • ප්‍රංශ විප්ලවයට බලපෑ හේතු<br>  • විප්ලවයේ ආරම්භය හා වර්ධනය<br>  • විප්ලවයේ ප්‍රධාන අවස්ථා | 15 |
| | 7.2 තම ප්‍රංශ වාසීන් ගෙනගිය විප්ලවයේ ප්‍රතිඵල වු මුලික මිනිස් අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට දායක වෙයි. | • විප්ලවයේ ප්‍රතිඵල | |
| 8.0 වැදගත් ඓතිහාසික පුද්ගලයන්ගේ ක්‍රියාවලින් ඉතිහාසය ගොඩනැගීමට දායක වු අයුරු පරීක්ෂා කරයි. | 8.1 නැපෝලියන්ගේ ප්‍රතිසංස්කරණ ප්‍රංශ ජාතිකත්වය ගොඩනැගීමට දායක වු ආකාරය පැහැදිලි කරයි. | • නැපෝලියන් බොනපාට් හා ඔහුගේ අධිරාජ්‍යය<br>  • නැපෝලියන් බලවත් වීමට හේතු<br>  • නැපෝලියන්ගේ ප්‍රතිසංස්කරණ<br>  • නැපෝලියන්ගේ විදේශ ප්‍රතිපත්ති | 15 |
| | 8.2 ශ්‍රේෂ්ඨ අධිරාජ්‍යයක් වු නැපෝලියන් පරාජය වීමට හේතු විග්‍රහ කරයි. | • නැපෝලියන් පරාජය වීමට හේතු | |

## 3.4 - 12 වන ශ්‍රේණිය නූතන ලෝකය ඉතිහාසය (ක්‍රි.ව. 1500 සිට 1989 දක්වා)

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | කාලච්ඡේද ගණන |
|---|---|---|---|
| 1.0 නූතන ලෝකයේ උදාවට බලපෑ යුරෝපීය බලවේග පිළිබඳ ව විග්‍රහ කරයි. | 1.1 වාණිජ ධනවාදයේ නැගීම නූතන ලෝකයේ උදාවට බලපෑ ආකාරය විග්‍රහ කරයි.<br>1.2 පුනරුදය තුළින් නව ලොවක් උදා වූ ආකාරය විග්‍රහ කරයි<br>1.3 පුනරුදයේ දේශපාලන නවෝදය ජාතිකරාජ්‍යයන්ගේ නැගීම ඇසුරින් පරීක්ෂා කරයි.<br>1.4 භූදකලාව පැවැති රටවල් නව ලෝකයට විවර වූ අයුරු දේශගවේෂණ ව්‍යාපාරය ඇසුරින් විග්‍රහ කරයි.<br>1.5 ආගමික ප්‍රතිසංස්කරණ නූතන ලෝකයේ උදාවට දායක වූ අයුරු විමසා බලයි. | • නූතන ලෝකයේ උදාව<br>• වැඩවසම් ක්‍රමයේ පරිහානිය හා වාණිජ ධනවාදයේ නැගීම<br>• පුනරුදය<br>• ජාතික රාජ්‍යයන්ගේ නැගීම<br>• යුරෝපයේ දේශ ගවේෂණ ව්‍යාපාරය හා බලව්‍යාප්තිය<br>• ආගමික ප්‍රතිසංස්කරණ | 30 |

| නිපුණතාව | නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලච්ඡේද ගණන |
|---|---|---|---|
| 2.0 ලොව සෙසු රටවල දේශපාලන, සමාජ, ආර්ථික රටාවන් වෙනස් කිරීමට යුරෝපයේ බලපෑම විග්‍රහ කරයි. | 2.1 යුරෝපයේ බලවත් රාජ්‍ය ලෝකය පුරා තම බල පරාක්‍රමය ව්‍යාප්ත කළ ආකාරය විග්‍රහ කරයි. | • යුරෝපා බල ව්‍යාප්තිය<br>• ස්පාඤ්ඤ අධිරාජ්‍යයේ ව්‍යාප්තිය<br>• පෘතුගාල අධිරාජ්‍යයේ ආරම්භය හා ව්‍යාප්තිය<br>• නෙදර්ලන්ත (ඕලන්ද) බල ව්‍යාප්තිය<br>• ප්‍රංශ බල ව්‍යාප්තිය<br>• ඉංග්‍රීසි බල ව්‍යාප්තිය | 20 |
| 3.0 ආසියාවේ ඓතිහාසික ගමන්මග වෙනස් කිරීමට දායක වූ යටත් විජිතවාදයේ බලපෑම පිළිබඳ විග්‍රහ කරයි. | 3.1 දකුණු ආසියාව හා අග්නිදිග ආසියාව යටත් විජිත වාදයට ගොදුරු වූ ආකාරය විග්‍රහ කරයි.<br><br>3.2 නැගෙනහිර ආසියාව පූර්ණ අධිරාජ්‍යවාදී අධිපත්‍යයට ගොදුරු නොවූ වද යටත් විජිතවාදී බලපෑමට ලක් වූ ආකාරය විග්‍රහ කරයි. | • ආසියාවේ යටත් විජිතවාදය<br>• ඉන්දියාව, චීනය, ජපානය,<br>• අග්නිදිග ආසියාව<br>• ඉන්දුනීසියාව, මලයාව,මියන්මාර්, සියම, වියට්නාමය, කාම්බෝජය, පිලිපීනය | 20 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | කාලච්ඡේද ගණන |
|---|---|---|---|
| 4.0 නූතන ලෝකයේ හැඩ ගැස්වීමට බලපෑ විප්ලව පිළිබඳ විග්‍රහ කරයි. | | • නූතන ලෝකය හැඩගැස්වූ විප්ලව | 40 |
| | 4.1 පාර්ලිමේන්තු බලය වර්ධනය කර ගැනීමට එංගලන්ත වාසීන් ගෙනගිය අරගලය මානව සංහතියේ ප්‍රගමනයට දායක වූ අයුරු ඉංග්‍රීසි විප්ලවය ඇසුරින් පරීක්ෂා කරයි. | • ක්‍රි.ව. 1688 ඉංග්‍රීසි විප්ලවය | |
| | 4.2 අධිරාජ්‍යවාදයට විරුද්ධ ව සිදු වූ පළමු නිදහස් සටන ලෙස ඇමරිකානු විප්ලවයේ වැදගත්කම විග්‍රහ කරයි. | • ඇමරිකානු විප්ලවය | |
| | 4.3 අයිතිවාසිකම් දිනා ගැනීම සඳහා ප්‍රංශවාසීන් ගෙනගිය විප්ලවයේ ප්‍රතිඵල මූලික මිනිස් අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට දායක වූ අයුරු විග්‍රහ කරයි. | • ප්‍රංශ විප්ලවය | |
| | 4.4 ලෝක ශිෂ්ටාචාරයේ පෝෂණයට රුසියානු විප්ලවයෙන් ලද ආභාසය විග්‍රහ කරයි. | • රුසියානු විප්ලවය | |
| | 4.5 කොමියුනිස්ට් වාදය ස්ථාපනය වූ අයුරු චීන විප්ලවය ඇසුරින් පරීක්ෂා කරයි. | • චීන විප්ලවය | |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | කාලච්ඡේද ගණන |
|---|---|---|---|
| 5.0 කාර්මික විප්ලවය තුළින් මිනිස් ක්‍රියාකාරිත්වය වෙනස්කමට ලක් කළ ආකාරය විග්‍රහ කරයි |  | • කාර්මික විප්ලවය හා එහි බලපෑම | 15 |
|  | 5.1 අතීත් කළ වැඩ යන්ත්‍රයට භාරදීමට බලපෑ සාධක විමසා බලයි. | • කාර්මික විප්ලවයට බලපෑ සාධක |  |
|  | 5.2 කාර්මික විප්ලවයේ තාක්ෂණ වර්ධනය පිළිබඳ විග්‍රහ කරයි. | • තාක්ෂණයේ වර්ධනය |  |
|  | 5.3 කාර්මික විප්ලවය ව්‍යාප්ත වු ආකාරය පිළිබඳ කරුණු ගොනු කරයි | • ව්‍යාප්තිය |  |
|  | 5.4 මිනිස් ක්‍රියාකාරකම් පහසු කිරීම සඳහා වර්ධනය වු කාර්මීකරණය හි ප්‍රතිඵල පිළිබඳ විග්‍රහ කරයි. | • ප්‍රතිඵල |  |

3.1 - 13 වන ශ්‍රේණිය ශ්‍රී ලංකාවේ ඉතිහාසය (ඈත අතීතයේ සිට ක්‍රි.ව 1978 දක්වා)

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | කාලච්ඡේද ගණන |
|---|---|---|---|
| 8.0 ශ්‍රී ලංකාව විවිධ කාලවකවානු වල සිදු වු දේශපාලන සංසිද්ධීන් දහසයවන සියවස ඇසුරින් විමර්ශනය කරමින් ඉන් ලද ආභාසය වර්තමාන හා අනාගතය සාර්ථක කරගැනීමට ඵලදායිව භාවිත කරයි. | 8.1 දහසයවන සියවසේ ලංකාවේ දේශපාලන ඉතිහාසය පිළිබඳ තොරතුරු ගොනු කරයි. | • දහසයවන සියවසේ ලංකාවේ දේශපාලන ඉතිහාසය<br>• රාජධානි<br>  • කෝට්ටේ රාජධානිය<br>  • යාපනය රාජධානිය<br>  • මහනුවර රාජධානිය<br>  • සීතාවක රාජධානිය | 25 |
| | 8.2 පාලනයේ පවතින දුර්වලතා විදේශීය අධිපත්‍ය ගොඩනැගීම සඳහා බලපාන ආකාරය පෘතුගීසීන් ලංකාවට පැමිණීම ඇසුරින් විග්‍රහ කරයි. | • පෘතුගීසින්ගේ පැමිණීම<br>  • පෘතුගීසි ආගමනය හා ඔවුන් දේශීය රාජධානිය සමග පැවැති සම්බන්ධතා<br>  • මුහුදුබඩ ප්‍රදේශවල පෘතුගීසි බලය තහවුරු වීම | |

| නිපුණතාව | නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලච්ඡේද ගණන |
|---|---|---|---|
| 9.0මහනුවර රාජධානියේ දේශපාලන, සමාජ, ආර්ථික සංසිද්ධීන් විමර්ශනය කරමින් ඉන් ලද ආභාසය වර්තමානය හා අනාගතය සාර්ථක කර ගැනීමට ඵලදායීව භාවිත කරයි. | 9.1මහනුවර රාජධානිය පෝෂණය කිරීමේලා පාලකයින්ගේ දායකත්වය පිළිබඳ තොරතුරු ගොනු කරයි.<br><br>9.2 මහනුවර රාජධානිය පෘතුගීසින් හා ලන්දේසීන් සමඟ පැවැත්වු සම්බන්ධතා තුලනාත්මක විග්‍රහ කරයි<br><br>9.3 මහනුවර රාජධානියේ පාලන, සමාජ, ආර්ථික හා සංස්කෘතික තත්ත්වය පිළිබඳ විමර්ශනය කරමින් තම උරුමයන් රැක ගැනීමට කටයුතු කරයි. | • මහනුවර රාජධානිය<br>• පළමුවන විමලධර්මසූරිය රජුගේ රාජ්‍ය කාලයේ සිට ශ්‍රී වික්‍රම රාජසිංහ රජුගේ රාජ්‍ය කාලයේ අවසානය දක්වා දේශපාලන ඉතිහාසය<br><br>• පෘතුගීසින් හා ලන්දේසීන්<br>• මහනුවර රාජධානිය පෘතුගීසීන් සමඟ පැවැත් වූ සම්බන්ධතා<br>• ලන්දේසීන්ගේ ආගමනය හා මහනුවර රාජධානිය ඔවුන් සමඟ පැවැත් වූ සම්බන්ධතා<br><br>• පාලන, සමාජ, ආර්ථිකය සංස්කෘතිය<br>• පරිපාලන තන්ත්‍රය<br>• සමාජ, ආර්ථික හා සංස්කෘතිය | 30 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | කාලච්ඡේද ගණන |
|---|---|---|---|
| 10.0 ශ්‍රී ලංකාවේ බටහිර ජාතීන්ගේ බල ව්‍යාප්තිය සහ ඒ සමග ඇති වූ සමාජ, දේශපාලන, ආර්ථික වෙනස්වීම් පිළිබඳ විමර්ශනය කර තම රටේ අනන්‍යතාවය රැක ගනිමින් ශක්තිමත් ජාතියක් ලෙස ගොඩනැගීමට දායක වෙයි. | 10.1 ලංකාවේ පෘතුගීසි හා ලන්දේසි පාලනය පිළිබඳ තොරතුරු ගොනු කරයි.<br><br>10.2 පෘතුගීසි හා ලන්දේසින් විසින් ලංකාවේ මුහුදුබඩ පළාත් තුළ ක්‍රියාත්මක කළ ආර්ථික හා ආගමික ප්‍රතිපත්ති පිළිබඳ විග්‍රහ කරයි<br><br>10.3 පෘතුගීසින් හා ලන්දේසීන්ගේ සමාජීය හා සංස්කෘතික බලපෑම පිළිබඳ විමර්ශනය කරයි. | • ලංකාවේ මුහුදු බඩ ප්‍රදේශවල පෘතුගීසි හා ලන්දේසි පාලනය<br>• පාලන තන්ත්‍රය<br><br>• ආර්ථික හා ආගමික ප්‍රතිපත්ති<br><br>• සමාජීය හා සංස්කෘතික බලපෑම් | 15 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | කාලච්ජෙද ගණන |
|---|---|---|---|
| 11.0 ශ්‍රී ලංකාවේ ඉංග්‍රීසි බල ව්‍යාප්තිය පිළිබඳ විමර්ශනය කර තම රටේ ස්වාධිපත්‍ය රැක ගැනීමේ අවශ්‍යතාවය පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි. | 11.1 බ්‍රිතාන්‍යයින් ලංකාවේ මුහුදුබඩ පළාත් වල බලය ලබාගත් ආකාරය විග්‍රහ කරයි. | • බ්‍රිතාන්‍යයන් ලංකාවට පැමිණීම<br>• මුහුදුබඩ පළාත්වල බ්‍රිතාන්‍ය බලය පිහිටුවීම. | 10 |
| | 11.2 බ්‍රිතාන්‍යයින් මහනුවර රාජධානිය අත්පත් කර ගත් අයුරු පරීක්ෂා කරයි. | • මහනුවර රාජධානිය අත්පත් කර ගැනීම. | |
| 12.0 ඉංග්‍රීසි ජාතීන් ශ්‍රි ලංකාවේ ඇති කළ දේශපාලන වෙනස්වීම් ස්වදේශිකයන්ට බලපෑ ආකාරය විග්‍රහ කරයි. | 12.1 ස්වාධිපත්‍ය රැක ගැනීම සඳහා බ්‍රිතාන්‍ය පාලනයට විරුද්ධව ස්වදේශිකයින් නැගී සිටි ආකාරය විග්‍රහ කරයි. | • බ්‍රිතාන්‍ය යටතේ ලංකාව<br>• බ්‍රිතාන්‍ය විරෝධී ව්‍යාපාරය<br>• ක්‍රි.ව.1818 සහ 1848 බ්‍රිතාන්‍ය විරෝධී නැගිටීම<br>• 1848 පසු රාජ්‍ය ප්‍රතිපත්ති වෙනස්වීම් | 20 |
| | 12.2 ලංකාවේ සමාජ ආර්ථික හා දේශපාලන වෙනස්කම් ඇති කිරීම සඳහා බ්‍රිතාන්‍යයන් විසින් හඳුන්වා දුන් අණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ පිළිබඳ ව විග්‍රහ කරයි. | • ආණ්ඩුක්‍රම විකාශය කෝල්බෲක් ප්‍රතිසංස්කරණ හා පරිපාලන ප්‍රතිසංස්කරණ | |

| නිපුණතාව | නිපුණතා මට්ටම් | විෂය අනතර්ගතය | කාලච්ඡේද ගණන |
|---|---|---|---|
| 13.0 බ්‍රිතාන්‍යයන් විසින් ඇති කළ සමාජ, ආර්ථික වෙනස්වීම් ලාංකික සමාජයට බලපෑ ආකාරය තුලනාත්මකව විග්‍රහ කරයි. | 13.1 ලංකාවේ වතු ආර්ථිකයේ විකාශනය පිළිබඳ තොරතුරු පැහැදිලි කරයි.<br><br>13.2 බ්‍රිතාන්‍ය යටතේ ලංකාවේ සමාජ, ආර්ථික වෙනස්කම් තුලනාත්මකව විග්‍රහ කරයි. | • වතු ආර්ථිකයේ වර්ධනය<br>• වතු ආර්ථිකයේ ආරම්භය හා වැවිලි බෝග<br><br>• ආර්ථික හා සමාජ වෙනස්වීම්<br>• මූල්‍ය සංස්ථා ප්‍රවාහනය හා සංනිවේදන ක්‍රමවල වර්ධනය<br>• දේශිය කෘෂි ආර්ථිකය<br>• සමාජීය වෙනස්කම් | 22 |
| 14.0 බ්‍රිතාන්‍යයන්ගේ ආගම් ප්‍රචාරක ව්‍යාපාරය හා ඊට එරෙහිව දේශීය ආගමික ප්‍රබෝධය පිළිබඳ අධ්‍යයනය කර තම අනන්‍යතාවය රැක ගැනීමේ අවශ්‍යතාවයට අනුව කටයුතු කරයි. | 14.1 ලංකාවේ මිෂනාරි ව්‍යාපාරය ක්‍රියාත්මක වූ අයුරු විමර්ශනය කරයි.<br><br>14.2 මිෂනාරි ව්‍යාපාරය නිසා බෞද්ධ හින්දු හා ඉස්ලාම් ප්‍රබෝධය ඇති වූ අයුරු විමර්ශනය කරයි. | • 19 වන සියවසේ ආගමික හා සංස්කෘතික පුනරුදය<br>• මිෂනාරී ව්‍යාපාරය<br><br>• බෞද්ධ හින්දු හා ඉස්ලාම් ප්‍රබෝධය | 14 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අනතර්ගතය | කාලච්ඡේද ගණන |
|---|---|---|---|
| 15.0 ශ්‍රී ලංකාවේ අධ්‍යාපනයේ විකාශනය පිළිබඳ තොරතුරු විග්‍රහ කරයි | 15.1 ශ්‍රී ලංකාවේ නූතන අධ්‍යාපනයේ වර්ධනය පිළිබඳ තොරතුරු ඇසුරින් පැහැදිලි කරයි | • නූතන අධ්‍යාපනයේ වර්ධනය<br>• බ්‍රිතාන්‍ය අධ්‍යාපනප්‍රතිපත්තිය<br>• නිදහස් අධ්‍යාපනයේ වර්ධනය | 12 |
| 16.0 ජාතික නිදහස ලබා ගැනීම සඳහා වු ව්‍යාපාර පිළිබඳ අධ්‍යයනය කර එම නිදහස ආරක්ෂා කර ගැනීමට කටයුතු කරයි. | 16.1මධ්‍යම පන්තියේ නැගීම හා ජාතික ව්‍යාපාරය ගොඩනැගීම පිළිබඳ තොරතුරු විග්‍රහ කරයි. | • ජාතික ව්‍යාපාර හා ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ<br>• මධ්‍යම පංතිය හා ජාතිකව්‍යාපාරය | 12 |
| | 16.2 ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ හා ජාතික නිදහස ලබාගැනීම පිළිබඳ තොරතුරු තුලනාත්මකව පැහැදිලි කරයි. | • ව්‍යවස්ථාදායකයේ වර්ධනය<br>• ඩොනමෝර් ආණ්ඩුක්‍රමය<br>• සෝල්බරි ආණ්ඩුක්‍රමය හා ජාතික නිදහස | |
| 17.0 ජාතික ස්වාධීනතාව තහවුරු කර ගැනීමට ගත් ප්‍රයත්න විමර්ශනය කරමින් යහ පාලනයට දායක වෙයි. | 17.1 නිදහසින් පසු ශ්‍රී ලංකාවේ ජාතික සංවර්ධනය සඳහා අනුගමනය කළ ප්‍රතිපත්ති පිළිබඳ තොරතුරු පැහැදිලි කරයි. | • නිදහසින් පසු ශ්‍රී ලංකාව<br>• ජාතික සංවර්ධනය සඳහා අනුගමනය කල ප්‍රතිපත්ති හා ක්‍රියාමාර්ග | 20 |
| | 17.2 නිදහසින් පසු ශ්‍රී ලංකාවේ දේශපාලන තත්ත්වය පරීක්ෂා කරයි. | • පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයේ වර්ධනය 1972 තෙක්<br>• විධායක ජනාධිපති ආණ්ඩුක්‍රමය 1978 | |

## 3.2 - 13 වන ශ්‍රේණිය ඉන්දියා ඉතිහාසය ( ඈත අතීතයේ සිට 1206 දක්වා)

| නිපුණතාව | නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලච්ඡේද ගණන |
|---|---|---|---|
| 6.0 මධ්‍යම පාලනයේ දුර්වලතා මත ප්‍රාදේශීය පාලකයෝ බලවත් වන ආකාරය ඉන්දීය ඉතිහාසය ඇසුරින් විග්‍රහ කරයි. | 6.1 වයඹ දිගින් ඉන්දියාවට පැමිණ බලපෑමක් කළ ජාතීහු පිළිබඳ තොරතුරු ගොනු කරයි.<br><br>6.2 මධ්‍යම පාලනයේ දුර්වලතා මත ඉන්දියානු ඉතිහාසයට බලපෑමක් කළ ප්‍රාදේශීය රාජයන් පිළිබඳ තොරතුරු ගොනු කරයි. | • මෞර්ය අධිරාජ්‍යයේ අවසානයේ සිට ගුප්ත අධිරාජ්‍යයේ ආරම්භය දක්වා ඉන්දියාවේ දේශපාලන හා සංස්කෘතික ඉතිහාසය<br>• ඉන්දු - ග්‍රීකයෝ (සංක්ෂිප්තව)<br>• ශක<br>• කුෂාණයෝ<br><br>• ශුංගයෝ<br>• සාතවහනයෝ | 20 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | කාලච්ඡේද ගණන |
|---|---|---|---|
| 7.0 ඉන්දියානු ශිෂ්ටාචාරයේ වර්ධනය හා ව්‍යාප්තිය පිළිබඳ අධ්‍යයනය කර ඉන් පෙරදිග ලෝකය ලද දායාද ගුප්ත අධිරාජ්‍ය ඇසුරින් විග්‍රහ කරයි. | 7.1 ඉන්දියානු ඉතිහාසය ගොඩනැගීමේ දී ගුප්ත අධිරාජ්‍යයෙන් වූ දායකත්වය පිළිබඳ තොරතුරු පැහැදිලි කරයි. | • ගුප්ත අධිරාජ්‍යය<br>• ගුප්ත අධිරාජ්‍යයේ බලව්‍යාප්තිය<br>• ගුප්ත අධිරාජ්‍යයේ පාලනය<br>• ආර්ථික තත්ත්වය<br>• කෘෂිකර්මය හා කර්මාන්ත<br>• දේශීය හා විදේශීය වෙළඳාම<br>• සංස්කෘතිය<br>• ආගම හා දර්ශනය, භාෂාව හා සාහිත්‍ය, වාස්තු විද්‍යාව, මූර්ති කලාව, හා චිත්‍ර කලාව | 24 |
| | 7.2 ගුප්ත අධිරාජ්‍යයේ පරිහානිය සිදු වූ ආකාරය පිළිබඳ තොරතුරු ගොනු කරයි. | • ගුප්ත අධිරාජ්‍යයේ පරිහානිය | |
| 8.0 දකුණු ආසියානු කලාපය කෙරෙහි පල්ලවයන්ගේ දේශපාලන හා සංස්කෘතික කටයුතු වලට බලපෑ ආකාරය විග්‍රහ කරයි. | 8.1 පල්ලව බල ව්‍යාප්තිය සිදු වූ ආකාරය පැහැදිලි කරයි. | • පල්ලවයන්ගේ දේශපාලන හා සංස්කෘතික කටයුතු<br>• පල්ලව බල ව්‍යාප්තිය | 12 |
| | 8.2 පල්ලව සංස්කෘතිය පිළිබඳ තොරතුරු පැහැදිලි කරයි | • පල්ලව සංස්කෘතිය | |
| | 8.3 පල්ලවයන්ගේ විදේශ සම්බන්ධතා හා එම රටවල් කෙරෙහි පල්ලව බලපෑම පිළිබඳ විග්‍රහ කරයි. | • පල්ලවයන්ගේ විදේශ සබඳතා<br>• විදේශ රටවල් කෙරෙහි පල්ලව බලපෑම | |

| නිපුණතාව | නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලච්ඡේද ගණන |
|---|---|---|---|
| 9.0 ඉන්දියානු ශිෂ්ටාචාරයේ වර්ධනය හා ව්‍යාප්තිය පිළිබඳ අධ්‍යයනය කර ඉන් පෙරදිග ලෝකය ලද දායාද විග්‍රහ කරයි. | 9.1 ගුප්ත යුගය අවසානයේ සිට මුස්ලිම් ආක්‍රමණ දක්වා වූ කාලය තුළ උතුරු ඉන්දියාවේ ඓතිහාසික සන්ධිස්ථාන පිළිබඳ තොරතුරු පැහැදිලි කරයි. | • ගුප්ත යුගය අවසානයේ සිට මුස්ලිම් ආක්‍රමණ දක්වා වූ කාලය තුළ උතුරු ඉන්දියාවේ ඓතිහාසික සන්ධිස්ථාන<br>• ගුප්ත යුගයේ අවසානයේ සිට මුස්ලිම් ආක්‍රමණ තෙක්<br>  • හර්ෂවර්ධන රජු යටතේ කනෞජයේ නැගීම<br>  • කනෞජයේ බලය සඳහා ක්‍රියාත්මක අරගල<br>  • පාල රජවරුන්ගේ දේශපාලන හා සංස්කෘතික කාර්ය සංසිද්ධීන් | 22 |
| | 9.2 ඉන්දියාවේ පැවැති සභ්‍යත්වය පුළුල් විපර්යාසයක් ඇති කිරීමට මුස්ලිම් ආක්‍රමණ පදනම සකස් වූ ආකාරය පැහැදිලි කරයි. | • මුස්ලිම් ආක්‍රමණ හා ඉන්දියාව<br>  • අරාබි හා තුර්කි ආක්‍රමණ<br>  • ඉන්දියාව මුස්ලිම් බලය යටතට පත්වීම | |
| 10.0 දක්ෂිණ පථයේ වැදගත් ප්‍රාදේශීය රාජ්‍යවල ඉතිහාසය විග්‍රහ කරයි. | 10.1 ඉන්දියාවේ දක්ෂිණ පථය කෙරෙහි චාලුක්‍ය ක්‍රියාකාරිත්වය පරීක්ෂා කරයි.<br><br>10.2 රාෂ්ටකූටයන් හා පාණ්ඩ්‍යයන්ගේ දේශපාලන ක්‍රියාකාරිත්වය පිළිබඳ විමසා බලයි. | • චාලුක්‍යයන්ගේ රාෂ්ටකූටයන්ගේ හා පාණ්ඩ්‍යයන්ගේ සංක්ෂිප්ත දේශපාලන ඉතිහාසය | 20 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | කාලච්ඡේද ගණන |
|---|---|---|---|
| 11.0 ඉන්දීය ඉතිහාසය හැඩගැසීමේලා දකුණු ඉන්දියානු සභ්‍යත්වයෙහි බලපෑම විග්‍රහ කරයි. | 11.1 චෝළ අධිරාජ්‍යයේ ප්‍රභවය හා වර්ධනය පිළිබඳ තොරතුරු පැහැදිලි කරයි. | • චෝළ අධිරාජ්‍යය<br>• චෝළ අධිරාජ්‍යයේ ප්‍රභවය හා වර්ධනය<br>• පළමුවන පරන්තක, පළමුවන රාජේන්ද්‍ර, පළමුවන කුලෝත්තුංග | 20 |
| | 11.2 චෝළ අධිරාජ්‍යය ඉන්දියාවෙන් බැහැරට ව්‍යාප්ත වූ අයුරු පරීක්ෂා කරයි. | • චෝළ අධිරාජ්‍ය ඉන්දියාවෙන් බැහැරට ව්‍යාප්ත වීම | |
| | 11.3 චෝළ පාලන තන්ත්‍රය ගොඩනැගී තිබූ ආකාරය පරීක්ෂා කරයි. | • චෝළ පාලන තන්ත්‍රය | |
| | 11.4 චෝළයන්ගේ සමාජීය, ආර්ථික හා සංස්කෘතික තොරතුරු ගොනු කරයි. | • චෝළ සමාජීය හා ආර්ථික තත්ත්වය<br>• සංස්කෘතිය<br>ආගම, භාෂාව හා සාහිත්‍ය, වාස්තු විද්‍යාව, මූර්ති කලාව හා චිත්‍ර කලාව | |

3.3 - 13 වන ශ්‍රේණිය යුරෝපා ඉතිහාසය (ක්‍රි.ව.1500 සිට 1989 දක්වා)

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | කාලච්ඡේද ගණන |
|---|---|---|---|
| 9.0 මානව ශිෂ්ටාචාර වර්ධනයේ දී ලෝක සාමය ආරක්ෂා කර ගැනීම සඳහා ගොඩනැගුණ බලවේග පිළිබඳ පරීක්ෂා කරයි. | 9.1 වියානා සම්මේලනය ක්‍රියාත්මක වීම පිළිබඳ විග්‍රහ කරයි.<br><br>9.2 පසුකාලීන ලෝක සාමය පවත්වා ගැනීම කෙරෙහි වියානා සම්මේලනය දායක වූ අයුරු පරීක්ෂා කරයි. | • වියානා සම්මේලනය<br>• වියානා සම්මේලනය හැඳින්වීම<br>• වියානා සම්මේලනය කැඳවීමට හේතු<br>• වියානා සම්මේලනයට මුහුණදීමට සිදුවූ ගැටලු<br>• වියානා සම්මේලනය අනුගමනය කළ ක්‍රියාමාර්ග<br>• වියානා සම්මේලනයේ ප්‍රතිඵල | 15 |
| 10.0 ලෝක ඉතිහාසය ගොඩනැගීමට පාදක වූ දේශපාලන බලවේග පිළිබඳ ඉතාලිය හා ජර්මනිය ඇසුරින් තුලනාත්මකව විග්‍රහ කරයි. | 10.1 ලිබරල්වාදී හා ජාතිකවාදී චින්තනවල වර්ධනය ඇසුරින් ලෝක ඉතිහාසය ගොඩනැගීමට පාදක දේශපාලන බලවේග පිළිබඳ තොරතුරු පහදයි. | • ක්‍රි.ව. 1815 න් පසු ලිබරල්වාදී හා ජාතිකවාදී චින්තනයේ සහ බලවේගවල වර්ධනය<br>• දේශපාලන චින්තනය<br>• ලිබරල්වාදය හා ජාතිකවාදය හැඳින්වීම<br><br>• ලිබරල්වාදී හා ජාතිකවාදී ව්‍යාපාරවල වර්ධනය | 27 |
| | 10.2 ඉතාලිය එක්සත් කිරීම හා ජර්මනිය එක්සත් කිරීමේ ව්‍යාපාරය ඇසුරින් ලිබරල්වාදය හා ජාතිකවාදය ප්‍රායෝගිකව භාවිත වූ අයුරු පරීක්ෂා කරයි. | • දේශපාලන චින්තන ප්‍රායෝගිකව භාවිත වීම<br>• ඉතාලිය එක්සත් කිරීම<br>• ජර්මනිය එක්සත් කිරීම | |

| නිපුණතාව | නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලච්ඡේද ගණන |
|---|---|---|---|
| 11.0 පළමු වන ලෝක යුද්ධයේ බිහිසුණු බව හා සාමයේ අර්ථවත් බව තුලනාත්මකව විග්‍රහ කරයි. | 11.1 පළමුවන ලෝක සංග්‍රාමය මානව සංහතියේ ඉදිරි ගමනට බාධාකාරි වූ ආකාරය විමර්ශනය කරමින් සංග්‍රාම තත්වයන්ගෙන් වැළකී සිටීමට කටයුතු කරයි.<br><br>11.2 ලෝක සාමය ආරක්ෂා කිරීමේ ප්‍රයත්නයක් වශයෙන් ජාතීන්ගේ සංගමයේ ක්‍රියාකාරිත්වය තුලනාත්මක ව පරීක්ෂා කරයි. | • පළමුවන ලෝක මහා සංග්‍රාමය<br>  • සංග්‍රාමය<br>    • හේතු<br>      • දිගු කාලීන හේතු<br>      • කෙටි කාලීන හේතු<br>    • සංග්‍රාමය ව්‍යාප්ත වීම<br>    • ප්‍රතිඵල<br>  • ජාතීන්ගේ සංගමය<br>    • අරමුණු හා ආරම්භය<br>    • ජාතීන්ගේ සංගමයේ ලක්ෂණ (යහපත් /අයහපත්) | 15 |
| 12.0මානව සංහතියේ ප්‍රගමනයට සම්බන්ධ වැදගත් වූ විප්ලවීය බලවේග පිළිබඳ විග්‍රහ කරයි. | 12.1. රුසියන් විප්ලවයට හේතු හා විප්ලවය සිදුවූ ආකාරය පැහැදිලි කරයි.<br><br>12.2 ලෝක ශිෂ්ටාචාරයේ පෝෂණයට රුසියන් විප්ලවයෙන් ලද ආභාසය පිළිබඳ තොරතුරු ගොනු කරයි. | • රුසියන් විප්ලවය<br>  • රුසියන් විප්ලවයට බලපෑ හේතු<br>  • විප්ලවය සිද්ධ වූ ආකාරය<br><br>  • රුසියන් විප්ලවයේ වැදගත්කම | 15 |

| නිපුණතාව | නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලච්ඡේද ගණන |
|---|---|---|---|
| 13.0 ලෝක ඉතිහාසය ගොඩනැගීමට පාදක වූ දේශපාලන බලවේග පිළිබඳ පැසිස්ට්වාදය හා නාසිවාදය ඇසුරින් තුළනාත්මකව විග්‍රහ කර බලයි. | 13.1 පැසිස්ට්වාදය හා නාසි වාදය ක්‍රියාත්මක වූ ආකාරය පරීක්ෂා කරයි.<br><br>13.2 පැසිස්ට් හා නාසිවාදය අතර සම්බන්ධතාවය පැහැදිලි කරයි. | • පැසිස්ට්වාදය හා නාසිවාදය<br>• ඉතාලියේ පැසිස්ට්වාදය<br>• පැසිස්ට්වාදය වර්ධනය වීමට හේතු<br>• පැසිස්ට්වාදයේ ප්‍රතිඵල<br>• ජර්මනියේ නාසිවාදය<br>• නාසිවාදය වර්ධනය වීමට හේතු<br>• නාසිවාදයේ ප්‍රතිඵල<br>• පැසිස්ට්වාදය හා නාසිවාදයේ සම්බන්ධතාව | 15 |
| 14.0 දෙවන ලෝක යුද්ධයේ බිහිසුණු බව හා සාමයේ අර්ථවත් බව පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි. | 14.1 දෙවන ලෝක සංග්‍රාමය මානව සංහතියේ ඉදිරිගමනට බාධාකාරී වූ ආකාරය විමර්ශනය කරමින් සංග්‍රාම තත්ත්වයන්ගෙන් වැළකී සිටීමට කටයුතු කරයි.<br><br>14.2 ලෝක සාමය ආරක්ෂා කර ගැනීමේ මාර්ගයක් වශයෙන් පිහිටුවා ගත් එ.ජා.සංවිධානය පිළිබඳ පැහැදිලි කරයි. | • දෙවන ලෝක මහා සංග්‍රාමය<br>• සංග්‍රාමය<br>• හේතු<br>• සංග්‍රාමය<br>• ප්‍රතිඵල<br><br>• එක්සත් ජාතීන්ගේ සංවිධානය<br>• අරමුණු හා ආරම්භය<br>• එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ව්‍යුහය<br>• අනුබද්ධ ආයතන<br>• වැදගත්කම<br>• මුහුණපා ඇති ගැටලු | 15 |

| නිපුණතාව | නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලච්ඡේද ගණන |
|---|---|---|---|
| 15.0 ලෝකයේ වර්තමාන දේශපාලන පදනම ගොඩ නැගීමට පාදක වු ප්‍රධාන බලවේග පිළිබඳ තුලනාත්මක ව විග්‍රහ කරයි. | 15.1 සෝවියට් දේශය හා ඇමරිකා එක්සත් ජනපදය සමාජවාදී හා ධනවාදී බලකඳවුරු ලෙස නැගී සිටිමින් ලෝක දේශපාලනය කෙරෙහි ඇති කල බලපෑම පැහැදිලි කරයි.<br><br>15.2 නිරවි සමයේ බල කඳවුරු අතර සාමය ආරක්ෂා කිරීම සඳහා එක්සත් ජාතින්ගේ සංවිධානයේ දායකත්වය අගය කරමින් කථා කරයි. | • දෙවන ලෝක මහා සංග්‍රාමයෙන් පසු ලෝකය<br>• බල කඳවුරු<br>• සමාජවාදී<br>• ධනවාදී<br>• නොබැඳි ජාතීන්<br><br>• නිරවි යුද්ධය<br>• මත ගැටුම<br>• මත ප්‍රචාරයට පොදු විධිවිධාන<br>• නිරවි යුද්ධය දියවී යාම<br>• එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ක්‍රියාකාරිත්වය | 25 |

## 3.4 - 13 වන ශ්‍රේණිය නූතන ලෝක ඉතිහාසය (ක්‍රි.ව. 1500 සිට 1989 දක්වා)

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | කාලච්ඡේද ගණන |
|---|---|---|---|
| 7.0 ලෝකයේ ආර්ථික හා දේශපාලන රටාවන් පුළුල් විපර්යාසයකට ගොදුරු කළ නව අධිරාජ්‍යවාදය පිළිබඳ විග්‍රහ කරයි. | 7.1 නව අධිරාජ්‍යවාදය යනු කුමක්දැයි හඳුන්වා දෙමින් එවැනි තත්ත්වයන් මතුවීමට හේතු පරීක්ෂා කරයි.<br><br>7.2 අප්‍රිකාව සඳහා වූ තරඟය පිළිබඳ තොරතුරු පැහැදිලි කරයි | • නව අධිරාජ්‍යවාදය<br>  • නව අධිරාජ්‍යවාදය හැඳින්වීම<br>  • නව අධිරාජ්‍යවාදය නැගී ඒමට පාදක වූ ඓතිහාසික පසුබිම<br>  • අප්‍රිකාව සඳහා වූ තරඟය | 15 |
| 8.0 පළමුවන ලෝක යුද්ධයේ බිහිසුණු බව පිළිබඳ අධ්‍යයනය කර සාමය ආරක්ෂා කර ගැනීමට පෙළඹෙයි. | 8.1 පළමුවන ලෝක යුද්ධය මානව සංහතියේ ඉදිරි ගමනට බාධාකාරී වූ ආකාරය පැහැදිලි කරයි.<br><br>8.2 සංග්‍රාම තත්වයන්ගෙන් වැළකී සිටීමට කටයුතු කරයි. | • පළමුවන ලෝක යුද්ධය<br>  • යුද්ධයට බලපෑ ඓතිහාසික පසුබිම<br>  • පෙරමුණ හා විවිධ පාර්ශව<br><br>  • යුද්ධයේ ප්‍රතිඵල<br>    • ජාතීන්ගේ සංගමය<br>    • නව රාජ්‍යවල නැගීම | 14 |

| නිපුණතාව | නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලච්ඡේද ගණන |
|---|---|---|---|
| 9.0 වර්තමාන ලෝකයේ දේශපාලන පදනම ගොඩනැගීමට පාදක වූ ප්‍රධාන බලවේග පිළිබඳ තුලනාත්මක විග්‍රහ කරයි. | 9.1 ඇමරිකා එක්සත් ජනපදය ධනවාදී බලකඳවුර ලෙස නැගී සිටිමින් ලෝක දේශපාලනය කෙරෙහි බලපෑ ආකාරය පැහැදිලි කරයි. | • ඇමෙරිකා එක්සත් ජනපදය හා සෝවියට් දේශයේ නැගීම.<br>• ඇමෙරිකා එක්සත් ජනපදය<br>• සිවිල් යුද්ධයේ ඇ.එ.ජ. ශක්තිමත් වීම<br>• ඇ.එ.ජ. විදේශ බල ව්‍යාප්තිය<br>• ආර්ථික<br>• යුධ ශක්තිය<br>• විදේශ බල ව්‍යාප්තිය | 20 |
| | 9.2 සෝවියට් දේශය සමාජවාදී බල කඳවුර ලෙස නැගී සිටිමින් ලෝක දේශපාලනය කෙරෙහි ඇතිකළ බලපෑම පිළිබඳ තොරතුරු හෙළි කරයි. | • සෝවියට් දේශය<br>• විප්ලවයෙන් පසු සමාජවාදය ගොඩනැගීම.<br>• සෝවියට් දේශය යුරෝපයේ බලවතුන් බවට පත්වීම | |
| 10.0 නූතන ලෝකයේ අධිරාජ්‍යවාදය දෙදරවීමේ විවිධ ව්‍යාපාර විමර්ශනය කරමින් නිදහසේ අගය වටහා ගෙන කටයුතු කරයි. | 10.1 ලෝකය පුරා පැවති අධිරාජ්‍ය විරෝධී සටන් ව්‍යාපාර පිළිබඳ ව තොරතුරු ගොනු කරයි. | • අධිරාජ්‍ය විරෝධී ජාතික සටන් ව්‍යාපාර<br>• ලතින් ඇමරිකාව | 20 |
| | 10.2 ආසියාවේ අධිරාජ්‍ය විරෝධී ජාතික සටන් ව්‍යාපාර පිළිබඳ තොරතුරු පැහැදිලි කරයි. | • ආසියාව<br>• දකුණු ආසියාව, අග්නිදිග ආසියාව, බටහිර ආසියාව | |
| | 10.3 අප්‍රිකාව තුළ අධිරාජ්‍ය විරෝධී සටන් ව්‍යාපාර ඇති වූ ආකාරය පරීක්ෂා කරයි. | • අප්‍රිකාව | |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | කාලච්ඡේද ගණන |
|---|---|---|---|
| 11.0 දෙවන ලෝක යුද්ධයේ බිහිසුණු බව අධ්‍යයනය කරමින් සාමයේ අර්ථවත් බව වටහා ගෙන කටයුතු කරයි. | 11.1 දෙවන ලෝක මහා යුද්ධය පිළිබඳ තොරතුරු පැහැදිලි කරයි.<br><br>11.2 මානව සංහතියේ ඉදිරි ගමනට දෙවන ලෝක යුද්ධයේ බලපෑම එහි ප්‍රතිඵල ඇසුරින් විග්‍රහ කරයි. | • දෙවන ලෝක යුද්ධය<br>• යුද්ධයට බලපෑ හේතු<br>• පෙරමුණ හා පාර්ශව<br>• සංග්‍රාමෝපාය උපක්‍රම හා යුධ තාක්ෂණය<br>• ප්‍රතිඵල<br>• දෙවන ලෝක යුද්ධයෙන් පසු | 15 |
| 12.0 වර්තමාන ලෝක දේශපාලන පදනම ගොඩනැගීමට පාදක වූ ප්‍රධාන බලවේග පිළිබඳ විමර්ශනය කරමින් වර්තමාන ලෝක තත්ත්වය පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි. | 12.1 අවි ගැටුමින් තොරව සීතල යුද්ධයක් කරා ලෝකය ගමන් කළ ආකාරය ලෝකය බල කඳවුරුවලට බෙදී යාම ඇසුරින් විග්‍රහ කරයි.<br><br>12.2 මැදපෙරදිග දේශපාලන ප්‍රවණතා පිළිබඳ තොරතුරු පැහැදිලි කරයි.<br><br>12.3 ශක්තිමත් බල කඳවුරක් බිඳීයාම සෝවියට් දේශය ඇසුරින් විග්‍රහ කරයි. | • ලෝකය බල කඳවුරු වලට බෙදීයාම සහ බල කඳවුරු අතර පැවැති තරඟය<br>• මතවාද, දේශපාලන<br>• ආර්ථික<br>• තාක්ෂණය<br>• මැදපෙරදිග දේශපාලන ප්‍රවණතා පලස්තීනය, ඊශ්‍රායලය<br>• සෝවියට් දේශය බිඳවැටීම හා එහි ප්‍රතිඵල | 16 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | කාලච්ඡේද ගණන |
|---|---|---|---|
| 13.0 ලෝක සංකීර්ණ තත්ත්වයට මුහුණදීම සඳහා ජාත්‍යන්තර හා කලාපීය වශයෙන් සංවිධාන බිහි වූ ආකාරය විග්‍රහ කරයි. | 13.1 අවි ගැටුමින් තොර ලොවක් බිහිකර ගැනීම සඳහා පිහිටුවා ගත් එක්සත් ජාතීන්ගේ සංවිධානය පිළිබඳ තොරතුරු ගොනු කරයි. | • ජාත්‍යන්තර හා කලාපීය සංවිධානය<br>• එක්සත් ජාතීන්ගේ සංවිධානය | 25 |
| | 13.2 බ්‍රිතාන්‍ය අධිරාජ්‍ය බිඳවැටීමෙන් පසු එම අධිරාජ්‍යයට යටත් ව තිබූ රටවල් එංගලන්තය සමඟ සම්බන්ධතා පවත්වා ගැනීමට ගොඩනගා ගත් පොදු රාජ්‍ය මණ්ඩලය පිළිබඳ තොරතුරු පැහැදිලි කරයි. | • පොදු රාජ්‍ය මණ්ඩලය | |
| | 13.3 ප්‍රධාන බලකඳවුරු දෙකෙන් ආරක්ෂා වීම සඳහා ගොඩනගා ගත් නොබැඳි ජාතීන්ගේ සංවිධානය පිළිබඳ තොරතුරු පරීක්ෂා කරයි. | • නොබැඳී ජාතින්ගේ සංවිධානය | |
| | 13.4 සීතල යුද්ධ සමයේ බලකඳවුරු දෙක තම බලය ව්‍යාප්ත කර ගැනීම සඳහා බිහිකළ සංවිධානයෙහි ක්‍රියාකාරිත්වය පිළිබඳ තොරතුරු පැහැදිලි කරයි. | • ප්‍රධාන කඳවුරුවලට අයත් සංවිධාන<br>උතුරු අත්ලාන්තික් ගිවිසුම් සංවිධානය (NATO )<br>වොර්සෝ ගිවිසුම (WA RSO) | |
| | 13.5 කලාපීය වශයෙන් තම අවශ්‍යතා ඉටුකර ගැනීම සඳහා සංවිධාන ගොඩනගා ගැනීම පිළිබඳ විග්‍රහ කරයි. | • කලාපීය සංවිධාන<br>අග්නිදිග ආසියාතික ගිවිසුම්<br>අග්නිදිග සංවිධානය (SEATO)<br>ආසියන් සංවිධානය(ASEAN)<br>අප්‍රිකානු සමගි සංවිධානය(OAU)<br>යුරෝපීය සංගමය (EU)<br>සාර්ක්( SAARC )<br>අරාබි ලීගය (ARAB LEAGUE) | |

# 4.0 ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

ඉතිහාසය උගන්වන ගුරුවරයා, තොරතුරු ලබා දෙන්නෙකුට වඩා තොරතුරු ලබා ගැනීමට තම සිසුන් පොළඹවන්නකු ලෙස කටයුතු කරන්නේ නම් ඉගැන්වීමේ කාර්යය වඩා ඵලදායී වනු ඇත. මේ සඳහා හැකි සෑම අවස්ථාවක දී ම සාකච්ඡාව, මූලාශ්‍රය පරිහරණය, නිරීක්ෂණය වැනි කාර්යයන්ට සිසුන් යොමු කිරීම මැනවි. ඉතිහාසය අර්ථාන්විත ව අධ්‍යයනය කිරීම සඳහා සිසුන් යොමු කරවිය හැකි ක්‍රියාමාර්ග කිහිපයක් පහත දැක්වේ.

- ජාතික කෞතුකාගාරය සහ ප්‍රාදේශීය කෞතුකාගාර යනාදිය මගින් සැලසුම් කළ වැඩ සටහනක් යටතේ කෞතුක වස්තු නැරඹීමට අවස්ථාව සැලසීම.
- සිසුන් ප්‍රදේශයේ ඉතිහාසය සෙවීමට උනන්දු කර ඒ මගින් ජාතික ඉතිහාසය වෙත යොමු කිරීම.
- මාධ්‍යවලින් තොරතුරු ලබා ගැනීමට අවස්ථාව සැලසීම. (ගුවන් විදුලි හා රූපවාහිනී හා අන්තර් ජාලයේ ඇති අධ්‍යාපන සේවා)
- ඓතිහාසික වැදගත්කමකින් යුත් ස්ථාන නැරඹීමට උනන්දු කරවීම.
- මූලාශ්‍රය භාවිතයට උනන්දු කරවීම.
- සිසු කුසලතාවලට අවස්ථාව සැලසෙන පරිදි බිත්ති පුවත්පත්, සඟරා, ප්‍රදර්ශන,පාසල් කෞතුකාගාර ඇරඹීම වැනි කටයුතු කෙරෙහි ධෛර්ය දීම.
- කාලීන ප්‍රශ්න දෙස මධ්‍යස්ථව හා යථාර්ථවාදී ව බැලිය හැකි ඵලදායී පුරවැසියකු බිහි කිරීමේ කාර්යයට ඉතිහාසය විෂය ඉගැන්වීමෙන් ඔබට දායක විය හැකි ය. ඒ සඳහා ඔබ සතු වගකීම ඉතා විශාල ය.

## 5.0 පාසලේ ප්‍රතිපත්ති හා වැඩ සටහන්

ඉතිහාසය විෂය නිර්දේශයේ අන්තර්ගත විෂය කරුණු සාර්ථක ව හා ඵලදායි ලෙස අධ්‍යයනය කිරීම සඳහා ත් ඒ තුළින් ඉගෙනුම් අත්දැකීම් ලබා ගැනීම සඳහා ත් ශිෂ්‍ය සහභාගීත්වය වර්ධනය වන ආකාරයට පාසල් වැඩ සටහන් සම්පාදනය කර ගැනීමේ දී ඒවා අතිශයින් ම ප්‍රයෝජනවත් විය යුතු ය.

මෙහි යෝජනා කොට ඇත්තේ එවැනි පාසල් වැඩ සටහන් කිහිපයක් පමණි. මේ අනුව වෙනත් නිර්මාණාත්මක වැඩ සටහන් හා ප්‍රතිපත්ති සකස් කර ගැනීමේ නිදහස ඉතිහාසය උගන්වන ගුරුවරයාට හිමි වන බව සලකන්න.

- ඉතිහාසය සංගමයක් පිහිටුවීමෙන් සිසු දැනුම ප්‍රවර්ධනය සඳහා සාකච්ඡා, සම්මන්ත්‍රණ, වාද විවාද, ප්‍රදර්ශන පැවැත්වීමත්, සඟරා, බිත්ති පුවත්පත් නිර්මාණයන් කාර්යයන්ට යොමු කළ හැකි ය.

- යටත් පිරිසෙයින් වසරකට වරක්වත් ඓතිහාසික වැදගත්කමකින් යුත් ස්ථානයකට හෝ ප්‍රදේශයකට අධ්‍යාපන චාරිකා සංවිධානය කළ හැකි ය. පන්ති කාමරයේ දී ලබා ගත් දැනුම තහවුරු කර ගැනීමට හා වර්ධනය කර ගැනීමට හැකි වන පරිදි පූර්ව සැලසුමකින් යුතු ව අධ්‍යාපන චාරිකා සංවිධානය කිරීම වැදගත් වේ.

- පුද්ගල සම්මන්ත්‍රණ මගින් දිවයිනේ පිළිගත් ඉතිහාසඥයන් පාසලට කැඳවා ඔවුන්ගේ අත්දැකීම් බෙදා හදා ගැනීමට අවස්ථා සැලසිය හැකි ය.

- ප්‍රදේශයේ පුරාවිද්‍යාත්මක වටිනාකමකින් යුත් ස්මාරක පිළිබඳ සොයා බැලීම හා ඒවා ආරක්ෂා කිරීම සඳහා පාසල හා සම්බන්ධ ප්‍රජා වැඩ සටහන් කියාත්මක කිරීමට පුළුවන.

- ඉතිහාසය පාඩම්වලට අදාළ වන චිත්‍ර, මූර්ති, කැටයම් හා වෙනත් කෞතුක වස්තු නිරීක්ෂණය කිරිමටත්, නිරික්ෂණ වාර්තා සැපයීමටත් හැකි වන පරිදි කෞතුකාගාර වැඩ සටහන් සංවිධානය කිරීම

## 6.0 තක්සේරුව හා ඇගයීම

පාසල පදනම් කරගත් ඇගයීම් වැඩපිළිවෙල යටතේ එක් එක් වාරය සඳහා නියමිත නිපුණතා හා නිපුණතා මට්ටම් ආවරණය
වන පරිදි ඉගෙනුම් - ඉගැන්වීම් ඇගයීම් උපකරණ නිර්මාණාත්මකව පිළියෙල කොට ක්‍රියාත්මක කිරීම අපේක්ෂිත ය.

13 වන ශ්‍රේණිය අවසානයේ දී ජාතික මට්ටමේ ඇගයීම වන අ.පො.ස (උසස් පෙළ) විභාගය සඳහා මෙම විෂය නිර්දේශය නිර්දේශිත ය.

මෙම විෂය නිර්දේශය පදනම් කරගෙන ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන ජාතික මට්ටමේ විභාගය පළමු වරට 2011 වර්ෂයේ දී පැවැත්වේ.

මෙම විභාගයේ ප්‍රශ්න පත්‍රවල ආකෘතිය හා ස්වභාවය පිළිබඳ අවශ්‍ය විස්තර විභාග දෙපාර්තමේන්තුව මගින් සැපයෙනු ඇත.